**ඌව/ ප්‍රලේ/1/12/1** **2017.05.**

ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය (ඌව).

ලේකම්,
පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය(ඌව).

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම්),
ඌව පළාත් සභාව.

## ඩෙංගු මර්දන ජාතික වැඩපිළිවෙළ විධිමත් කිරීම
## ඌව පළාත් වැඩසටහන

ඩෙංගු මර්දන ජාතික වැඩපිළිවෙල විධිමත් කිරීම 2017.05.16 දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ඩෙංගු මර්දනය පිළිබඳව ජනාධිපති කාර්යය සාධන බලකායේ විශේෂ සාකච්ඡාවේදී ඉදිරිපත් වූ කරුණු සහ ඊට අදාළව ක්‍රියාත්මක කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරන ලද වැඩ සටහන පහත සඳහන් කරමි.

## සාකච්ඡා කළ කරුණු

01. 2014 වර්ෂයේ දී ඩෙංගු රෝගීන් 47, 240 ක් වාර්තා වූ අතර, 2015 දී එය 29,777 ක් දක්වා අඩු වුවත් නැවතත් 2016 වර්ෂයේ ඩෙංගු රෝගීන් 55,000 ක් පමණ වාර්තා වූ අතර ඒ අතරින් 93 දෙනෙකු මරණයට පත් වූ බවත් 2017 වර්ෂයේ මේ වන විට ඩෙංගු රෝගීන් 43,000 පමණ වාර්තාවී ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් පවසන ලදී. විශේෂයෙන්ම කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, යාපනය, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මඩකලපුව, රත්නපුර වැනි දිස්ත්‍රික්කවල ඩෙංගු රෝගීන් ව්‍යාප්තිය වැඩි බව ප්‍රකාශ කරන ලදී. මෙම තත්ත්වය ඉතා බරපතල තත්ත්වයක් බවත් මේ සඳහා පවතින අයහපත් දේශගුණික තත්ත්වය (Climate Change) සීඝ්‍ර නාගරිකරණය, ඩෙංගු කීටයන් වර්ග 4 ක් පැවතීම සහ ඒ නිසා වරින් වර ඩෙංගු පැතිරීමේ අවධානම වැඩිවීම සහ ඩෙංගු පාලනය පිළිබඳව පවතින වැඩපිළිවෙල අඩු පාඩු බලපාන බව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මතය විය.

ඩෙංගු රෝගයට ගොදුරු වන අය අතර ළමුන් පමණක් නොව වැඩිහිටියන්ද සිටින බවත්, වයස අවුරුදු 25- 65 අතර වයස් කාණ්ඩයේ අයට රෝගය වැළදීමේ ප්‍රමාණය වැඩිබවත් එය 60% පමණ බවත් සඳහන් විය.

මේ ආකාරයට රෝගීන් වැඩියෙන් වාර්තා වීම නිසා විශේෂයෙන් කොළඹ ආශ්‍රිත රෝහල් වල විශාල තද බදයක් පවතින බවත් මේ නිසා රෝගීන් කළමනාකරණය කිරීම අපහසු බවත් සඳහන් විය. මේ අනුව රෝහල් වල පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම ගැන සලකා කළුබෝවිල සහ රාගම රෝහල් සඳහා තාවකාලික ගොඩනැඟිලි ඉදි කළ යුතු බවට තීරණය විය.

02. ඩෙංගු රෝගය ව්‍යාප්තිය සහ වර්ධනය සඳහා බලපාන ප්‍රධාන සාධකය වන්නේ නිසි පරිදි කැළිකසළ බැහැර කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම නිසා බවත්, අවිධිමත් ලෙස බැහැර කරන කැලිකසළ සහ විශේෂයෙන්ම ජලය රැඳෙන හිස් භාජන ආදියේත්, පොලිතින් වැනි අපද්‍රව්‍ය නිසාත්, මදුරුවන් බෝවන ස්ථාන දිනෙන් දින වැඩිවන බව සඳහන් විය. විශේෂයෙන් නිවාස, පාසල්, රජයේ ආයතන, රෝහල් සහ ඉදිකිරීම් වැඩබිම්වල ඩෙංගු මදුරු කීටයන් බෝවන ස්ථාන පසුගිය දිනවල සිදු කරනු ලැබූ ස්ථානීය පරීක්ෂණ වලින් අනාවරණය වූ බව ප්‍රකාශ කරන ලදී.

03. කැලිකසළ බැහැර කිරීමේ වගකීම් පැවරෙන පළාත් පාලන ආයතන වලට අවශ්‍ය සම්පත් මානව සහ අනෙකුත් භෞතික සම්පත් ( ට්‍රැක්ටර්, කම්පැක්ටර් ) ප්‍රමාණවත්ව නොමැතිවීම ද ඊට අදාළ මූල්‍ය සම්පත් නොමැතිවීමත් මේ සඳහා බලපාන බව ප්‍රකාශ කරන ලදී.

04. තවද සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉල්ලා ඇති පරිදි ඩෙංගු මර්දන සහයකයින් තවදුරටත් බඳවා ගත යුතු බවට කරුණු ඉදිරිපත් වූ අතර බස්නාහිර පළාත් සභාවේ ඩෙංගු මර්දනය සඳහා උපාධිධාරින් පත් කිරීමට කටයුතු කර ඇති බවද සඳහන් විය. තවද කීට විද්‍යාඥයින්ගේ සේවාව නිසි පරිදි ලබා ගැනීම සඳහා සම්පත් නොමැති බවද ප්‍රකාශ කරන ලදී.

05. කසළ කළමනාකරණය අනුව නීති රීති ප්‍රමාණවත් නොවන බවත් ඒ සඳහා නීති රීති අවශ්‍ය පරිදි සංශෝධනය විය යුතු බවටත් සාකච්ඡා විය.

06. ඩෙංගු කීටයන් පාලනය සඳහා යොදාගනු ලබන ධූමායනය විධිමත් කළ යුතු බවත් BTI බැක්ටීරියා භාවිතය දැනට සිදු නොවන බවත් ප්‍රකාශ වූ අතර, දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන බැක්ටීරියා යොදා ගනිමින් නාගරිකව මදුරු කීටයන් පාලනය කළ යුතු බවත් තීරණය කරන ලදී.

07. ඩෙංගු මර්දන වැඩපිළිවලේදී පරිසර පොලිසිය විශාල සේවයක් කළත් අද වන විට එම සේවාව විධිමත්ව සිදු නොවන බවත් ඒ අනුව එම වැඩපිළිවෙල සාර්ථකව සිදු කළ යුතු බවටත් සාකච්ඡා විය.

08. ඩෙංගු මර්දනය සඳහා වන දැනුවත් කිරීම් ප්‍රමාණවත් නොවන බවත් විශේෂයෙන් මහජනතාවගේ දැනුවත් බාවය ප්‍රමාණවත් නොවන බවත් රෝගය පැතිරීම වැළැක්වීම සඳහා ගත යුතු පියවරවල් මෙන්ම රෝගය වැළදුණු පසු කළමනාකරණය කිරීම පිළිබඳව වෛද්‍ය ආයතන වල පවතින සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ විය. එසේම මේ සඳහා ප්‍රමාණවත් ප්‍රචාරණයක් ජනමාධ්‍ය මඟින් සිදු නොවන බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන් පරිසර සංරක්ෂණය පිළිබඳ පාසල් ළමුන්ගේ දැනුවත් බාවය සඳහා පරිසර සංරක්ෂණ විෂය පාසල් විෂය නිර්දේශට ඇතුළත් කළ යුතු බවත් සඳහන් විය.

**ඉහත සඳහන් කළ කරුණු වලට අදාළව ඌව පළාත තුළ ඩෙංගු ව්‍යාප්තිය පිළිබඳවද සලකා බලන විට පෙනී යන්නේ 2016 වර්ෂයට වඩා වැඩි ප්‍රමාණයකින් 2017 වර්ෂයේ ඩෙංගු රෝගීන් වාර්තා වන බවයි. බදුල්ල දිස්ත්‍රික්කයේ 2015 රෝගීන් 352 වාර්තා වූ අතර 2016 එම සංඛ්‍යාව 785 ක් විය. 2017 අද වන විට රෝගීන් 308 ක් වාර්තා වී ඇති අතර මේ වර්ෂය තුළ ඩෙංගු මරණ 1 ක් ද වාර්තා වී ඇත. මොනරාගල දිස්ත්‍රික්කයේ 2016 වර්ෂය ඩෙංගු රෝගීන් 369 වාර්තා වූ අතර 2017 අද වන විට රෝගීන් 333 ක් වාර්තා වී ඇත.**

**ඩෙංගු මර්දන ජාතික වැඩපිළිවෙල විධිමත්ව ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ගනු ලැබූ තීරණ,**

01. ඩෙංගු රෝගීන් වාර්තා වීමේ වර්තමාන ප්‍රවනතාවය අයහපත් ප්‍රතිඵල ඇති කළ හැකි බැවින් එම තත්ත්වය පාලනය කිරීම සඳහා කඩිනම් සහ අඛන්ඩ වැඩ පිළිවෙලක් ජූනි 01 දින සිට මාස 3 ක කාලයක් සඳහා අඛණ්ඩව ක්‍රියාවට නැංවීම.

02. ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳව පළාත් පාලන ආයතන වල පවතින ගැටළු අධ්‍යනය කර හිඟ සම්පත් සපයා ගැනීම ඇතුළු වැඩපිළිවෙළක් පළාත් පාලන කොමසාරිස් සහ පළාත් සෞඛ්‍ය බලධාරීන් සකස් කිරීම. මෙහිදී හදිසි අවශ්‍යතාව සඳහා ශ්‍රමය අවශ්‍ය වන්නේ නම් කොන්ත්‍රාත් පදනම මත තාවකාලිකව යොදවා ගැනීම. යන්ත්‍රෝපකරණ යාන වාහන

ආදිය අවශ්‍යතා තක්සේරු කර පළාත් ප්‍රධාන ලේකම්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයට යොමු කිරීම.

03. රජයේ කාර්යාල / වැඩබිම්වල / පුද්ගලික ආයතන සතියකට එක් දිනක එක පැයක් (01) පවිත්‍රා පැය ලෙස නම් කර සියලුම නිලධාරින් සහ සේවකයින් එම කාලය තුළ කාර්යාල / වැඩබිම් පිරිසිදු කිරීම, කැලිකසල බැහැර කිරීම සිදු කළ යුතුය.

04. පොදු ස්ථාන පවිත්‍රතා සඳහා මසකට වරක් ශ්‍රමදාන වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාවට නැංවීම.

05. ප්‍රජාව, රජයේ නිලධාරින් සහ පාසල් ළමුන් දැනුවත් කිරීමේ අඛණ්ඩ වැඩපිළවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

06. සියලුම ජනමාධ්‍ය මඟින් මෙම වැඩපිළිවෙළ සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දිය යුතුයි.

07. BTI බැක්ටීරියා මඟින් කීටයන් පාලනය කිරීමේ වැඩපිළිවෙළ පිළිබඳව ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී කටයුතු කළ යුතු බවට තීරණය විය.

08. සෑම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවක්ම මෙම වැඩ පිළිවෙළ පිළිබඳ ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී කටයුතු කළ යුතු අතර ඒ ඒ ආයතනයට / නිලධාරින්ට පැවරෙන වැඩ කොටස් නිසි පරිදි ඉටු කරන ලද්දේද යන්න විමර්ශනය කළ යුතුයි.

09. පරිසර පොලිසියේ කටයුතු ප්‍රති සංවිධානය කර ගම් මට්ටමේ ඒකාබද්ධ පරිසර වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළ යුතුයි.

10. එසේම මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවේ මානව හා භෞතික සම්පත්ද යොදා ගැනීමට කටයුතු කළ යුතු බවට තීරණය විය.

11. මදුරු පනතට නියමිත සංශෝධන ඉදිරිපත් කර අනුමත කරවා ගැනීම.

12. කීට සමීක්ෂණ අංශයට අවශ්‍ය සම්පත් සපයා දී ඔවුන්ගේ සේවාව නිසි පරිදි සෑම දිස්ත්‍රික්කයකටම ලබා දිය යුතුවේ.

ඉහත සඳහන් කළ සාකච්ඡා කළ කරුණු මත ගනු ලැබූ තීරණ පදනම් කර ගනිමින් ඩෙංගු මර්දනය සඳහා ප්‍රකාශිත මාස 3 ක් සඳහා වූ අඛණ්ඩ මෙහෙයුම් වැඩ සටහන් ඌව පළාතේ සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ.

එබැවින් ඔබ අමාත්‍යාංශ දෙකෙත්, ඔබ යටතේ පවතින දෙපාර්තමේන්තුත් අනෙකුත් ආයතන, දිසාපති කාර්යාල, ප්‍රාදේශීය ලේකම්වරුන්, රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් ප්‍රධානීන්, ත්‍රිවිධ හමුදා, ශ්‍රී ලංකා පොලිසිය, මධ්‍යම පරිසර අධිකාරිය වැනි ආයතන එක්ව අදාළ මෙහෙයුම් වැඩපිළිවෙළ සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.

මේ වැඩසටහන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීමේ අදියර සැලසුම් කිරීම හා මෙහෙයුම් කිරීමේ වැඩපිළිවෙලවල් සැලසුම් කිරීම ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය, ලේකම් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) යන නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් සිදු කළ යුතුය.

තවද ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පවතින ඩෙංගු මර්දන ඌව පළාත් මෙහෙයුම් කමිටුව වැඩසටහනට බද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ යුතුවේ.

**<u>ඔබ විසින් සකස් කරනු ලබන වැඩසටහන 2017.05.26 දිනට පෙර ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පළාත් පාලන ආයතන හා අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලට දන්වා යැවිය යුතුවේ.</u>**

තවද මේ වන විට මා විසින් ඌව පළාත් පාලන කොමසාරිස්වරයා අමතන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන සහ දිගු කාලීන කල්පවත්නා වැඩපිළිවෙළක් සකස් කරන ලෙස උපදෙස් දෙමින් ඊට අදාලව උපයෝගී කර ගත හැකි සංකල්ප හා මූලධර්ම පිළිබඳව මාර්ගෝපදේශන සංග්‍රහයක් ද යොමු කර ඇති බව සලකන්න. ( මේ ලිපියේ පිටපතක් දැන ගැනීම සහ ඉදිරි කටයුතු සඳහා ඔබ වෙත යොමු කර ඇත) මේ අනුව කසළ කළමනාකරණයේ දී අදාළ දීර්ඝ කාලීන සැලැස්ම සකස් කිරීම සඳහා ද ඔබගේ දායකත්වය ලබා දෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඉහළ ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කර ඌව පළාත තුළ ඩෙංගු ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ක්‍රියා කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ගාමිණී රාජකරුණා
උඖව පළාතේ ප්‍රධාන ලේකම්.

**<u>පිටපත</u> :-**

1. ගරු ආණ්ඩුකාරතුමා,ආණ්ඩුකාරවර කාර්යාලය - ඔබතුමාගේ කාරුණික දැන ගැනීම සඳහා

2. ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ඌව පළාත් සභාව - ඔබතුමාගේ කාරුණික දැන ගැනීම සඳහා

3. ගරු පළාත් අමාත්‍යතුමන්ලා - ඔබතුමන්ලාගේ කාරුණික දැන ගැනීම සඳහා

4. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - දැන ගැනීම පිණිස

5. දිස්ත්‍රික් ලේකම්, බදුල්ල / මොනරාගල - දැන ගැනීම පිණිස හා අවශ්‍ය කටයුතු සඳහා

6. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) - පළාත් සභා ආයතන ඩෙංගු මර්දන සඳහා

වන කමිටුව මෙහෙය වීම සඳහා